# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 580/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 04/04/2024 පැය 1000

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.04.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 60 | 280 | තඹ දඟර 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධී දුම් වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.04.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මාලිගාවත්ත පොලිස් වසමේ ඉක්බාල් මාවත කොළඹ 10 ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධි දුම් වැටි 15,000ක් සහ යතුරු පැදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මාලිගාවත්ත පොලිස් ස්ථානයටඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන විද්‍යාල මාවත කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නීති විරෝධී මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.04.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මන්නාරම පොලිස් වසමේ තලෙලෙ මන්නාරම, මන්නාරම මාර්යේ කට්ටුකාරන් කුඩුඉරිප්පු ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධි මත් කරල් සහ යතුරු පැදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තලෙලෙමන්නාරම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. තලෙලෙමන්නාරම පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**